**කෝරලේපත්තු ප්‍රාදේශීය සභාව**

**-----------------------------------------**

**මඩකලපුව දිස්ත්‍රික්කය**

**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**------------------------------------**

2015 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 19 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2015 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර 01 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**-----------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට කෝරලේපත්තු ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**----------------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**---------------------------**

සමාලෝචිත වර්ෂයේදී රු. 135 ,000 ක් ගෙවා මිලදී ගත් ඡායාස්ථ පිටපත් යන්ත්‍රය පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

#### 1.3.2 ලැබිය යුතු ගිණුම්

**----------------------**

තනතුර අතහැර ගිය සහ විශ්‍රාම ලබා ගිය සේවකයන් 24 දෙනෙකුට කලින් ලබා දී තිබුණ ණය මුදල්වලින් අය කර ගත යුතුව තිබුණ රු. 593,967 ක මුදල අදාල පුද්ගලයන්ගෙන් හෝ ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් අය කර ගැනීමට අවුරුදු දහයකට වඩා වැඩි කාලයක් කටයුතු නොකර දිගටම මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරිණි.

#### 1.3.3 නීති රීති රෙගුලාසි ආදියට අනුකූල නොවීම

**-----------------------------------------------------**

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය

| නීති රීති යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ)<u>1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති</u> | |
| 1 පරිච්ඡේදයේ 5 (12) රීති | මුදල් සහ ගබඩා වගකීම් රාජකාරි මට්ටමෙන් නිලධාරීන් තුන් දෙනෙකුට භාරදී ඇතත් එම අයගෙන් සුරැකුම් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |

(ආ) අංක IAI/2002/02 සහ 2002 නොවැම්බර් 28 දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, පරිගණක උපාංග සහ මෘදුකාංග යනාදිය ලේඛනගත කිරීමට පරිගණක ලේඛනයක් නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.12,468,433 කි. ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ වියදම් ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු. 10, 734,838 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු 1,733,595 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

2011 දී මාස හයක කාලයක් සභාවේ සේවයෙහි නියුක්තව සිටි සේවකයන් 14 දෙනෙකුට සේවක අර්ථ සාධක අරමුදලේ දායක මුදල වූ රු. 325,750 ක් නියමිත කාලය තුළ නොගෙවූ නිසා ඊට අදාල දඩය වශයෙන් රු 53, 927 ක් ද, එකතු කොට රු 379, 677 ක් සභාව විසින් ගෙවිය යුතුව තිබුණි.

**5. පද්ධති හා පාලන**

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් කළමනාකරණය

(ඇ) සන අපද්‍රව්‍ය කළමනාකරණය